# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 49 දරන
# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා
# (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූලි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 අගෝස්තු මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 25 යි.

# 1979 අංක 49 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූලි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 99/78.

1958 අංක 4 දරන ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1979 අංක 49 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනතේ දීර්ඝ නාමය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කරනු ලැබේ:— 1958 අංක 4 දරන පනතේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම.

"කෘෂිකාර්මික ව්‍යාපාර ඇති කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා සංස්ථාවක් පිහිටුවීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද ඒ කෘෂිකාර්මික ව්‍යාපාර නිශ්චය කිරීම සඳහා ද ඒ සංස්ථාවේ බලතල හා කාර්ය විධිමත් කිරීම සඳහා සහ ඒවා හා සම්බන්ධ හෝ ඒවාට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.".

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි හා වෙනත් යම් ලිඛිත නීතියක හෝ ප්‍රධාන ප්‍රඥප්තිය හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ නිකුත් කරනු ලැබූවාවූ ද සාදනු ලැබූවාවූ ද නියම කරනු ලැබූවාවූ ද හෝ බලය දෙනු ලැබූවාවූ ද යම් දැන්වීමක, සන්දේශයක, ආකෘතියක හෝ වෙනත් ලේඛනයක සඳහන් "ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය. ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බව.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

'(1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු සාමාජිකයන් සත් දෙනකුගෙන් සංස්ථාව සමන්විත විය යුතු ය. වැවිලි, කළමනාකරණය, ගණකාධිකරණය හෝ කම්කරු සම්බන්ධතා පිළිබඳ දැනීමක් ඇත්තාවූ හෝ කාර්මික, මුදල් හා වාණිජමය කාරණා පිළිබඳ ප්‍රවීණත්වයක් ඇත්තාවූ හෝ තැනැත්තන් අතුරින් ඒ සාමාජිකයන් පත් කරනු ලැබිය යුතු ය. ඒ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු මේ පනතේ මින් මතු "නිල සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ නිලධරයකු විය යුතු ය.'; තව ද

1—12,600 (79/06)

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (2) සංස්ථාවේ සාමාජිකයකුට, ඒ සාමාජිකයා වශයෙන් කටයුතු කිරීමට ඔහුට තාවකාලිකව නොහැකි වුවහොත් අමාත්‍යවරයා විසින්—

(අ) ඒ සාමාජිකයා නිල සාමාජිකයා නොවන අවස්ථාවක, සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් ක්‍රියා කිරීම පිණිස යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය ; තවද

(ආ) එසේ කටයුතු කිරීමට නොහැකි වන සාමාජිකයා නිල සාමාජිකයා වන අවස්ථාවක, සංස්ථාවේ සාමාජික යකු වශයෙන් ක්‍රියා කිරීම පිණිස මහා භාණ්ඩාගාර යේ වෙනත් යම් නිලධරයකු පත් කරනු ලැබිය හැකි ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (1) වන හා (2) වන උපවගන්තිවල දැක්වෙන " නිල සාමාජිකයකු " යන වචන වෙනුවට " නිල සාමාජිකයා " යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" සංස්ථාවේ අරමුණු.

5. (අ) ආණ්ඩුව විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් සංස්ථාව වෙත සතු කරන ලද හෝ පවරන ලද හෝ හිමි කරන ලද නැතහොත් සංස්ථාව විසින් අත්කර ගන්නා ලද කෘෂිකාර්මික හා වතු ඉඩම් කළමනාකරණය කිරීම සහ ඒ ඉඩම්වල වැසිම පලදාවක් ප්‍රවර්ධනය කිරීම ;

(ආ) පවත්නා වගාවන් පුනරුත්ථාපනය කිරීමෙන් හෝ ඒ ඉඩම්වල වගාවන් විවිධ කරණය කිරීමෙන් කෘෂිකාර්මික වගාවන් සම්බන්ධීකරණය කිරීම හා කළමනාකරණය කිරීම ;

(ඇ) ඒ ඉඩම්වල එළු ගව ආදී සතුන් ඇති කිරීම ;

(ඈ) කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කර විකිණීම ;

(ඉ) කෘෂිකාර්මික කාර්ය සඳහා පිරියත, උපකරණ හා යන්ත්‍රෝපකරණ ඒ ඉඩම්වල පිහිටුවා නඩත්තු කිරීම හා ක්‍රියාකාරීම ;

(ඊ) ආණ්ඩුව විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් සංස්ථාව වෙත සතු කරන ලද, පවරන ලද හෝ හිමි කරන ලද නැතහොත් සංස්ථාව විසින් අත්කර ගන්නා ලද වෙළෙඳ ව්‍යාපාර කළමනාකරණය කිරීම, පරිපාලනය කිරීම හා අධීක්ෂණය කිරීම;

(උ) සංස්ථාවේ ව්‍යාපාර කටයුතුවලට අදාළ ලේඛක කටයුතු, ගිණුම් සහ විගණනය හා සම්බන්ධ කර්තව්‍ය ඉටු කිරීම;

(ඌ) සංස්ථාවේ වැවිලි කටයුතු සම්බන්ධයෙන් පූර්ණ කළමනාකරණ සේවයක් සැල සීම;

(එ) ඒ ඉඩම් පිළිබඳ නියි කළමනාකරණයෙහි ලා අවශ්‍ය යයි සලකනු ලබන සියලු පියවර ගැනීම; සහ

(ඒ) සංස්ථාව මෙහෙයවීමෙහි ලා හා කළමනා කරණය කිරීමෙහි ලා ආනුෂංගික වෙ නත් යම් කටයුතු කරගෙන යාම

සංස්ථාවේ අරමුණු විය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි අතුරු වගන්තිය වෙනුවට, පහත දක්වෙන අලුත් අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් :—

"එසේ වුව ද අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව සංස්ථාව සතු කිසිම නිශ්චල දේපළක් කුලියට දීම, බදු දීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම නොකළ යුතු ය."; තව ද

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) (අ) සංස්ථාවේ අරමුණු අතුරින් යම් අරමුණක් හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික යම් කෘෂි කාර්මික, කාර්මික හෝ වාණිජමය අධිව්‍යාව සායක යෙදීමට;

(ආ) සංස්ථාව විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ හෝ සංස්ථාවට සේවය කරන තැනැත් තන් සඳහා ශුභ සාධක සහ වෙනත් විනෝද පහසුකම් ද නිවාස, නේවාසිකාගාර හා වෙනත් සමාන ඉඩකඩ ද ඇති කිරීමට, පවත්වා ගෙන යාමට හා සැලැස්වීමට;

(ඇ) සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීම හා අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය සියලු ගිවිසුම් හෝ එකඟවීම්වලට කෙළින්ම හෝ සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධර යකු, සේවකයකු හෝ අනුයෝජිතයකු මගින් හෝ අන් අයුරකින් ඇතුළත් වී, ඒවා ඉටු කිරීමට ;

(ඈ) සංස්ථාවේ කටයුතු කරගෙන යාම පිණිස අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම සඳහා වූ පහසු කම් සංස්ථාව විසින් සැලැස්වීම හා වෙනත් තැනැත්තන් විසින් සැලැස්වීමෙහි ලා සහාය වීම ද ඇතුළුව සංස්ථාව විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ තැනැත්තන්ගේ කෞශල්‍යය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා හෝ සංස්ථාවේ උපකරණවල කාර් යක්ෂමතාව හෝ ඒ උපකරණ ක්‍රියා කර වනු ලබන ආකාරය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය කිසිවක් කිරීමට ; සහ

(ඉ) සංස්ථාවේ අරමුණු මුදුන්පත් කර ගැනීමෙහි ලා අවශ්‍ය හෝ හිතකර හෝ ඊට ආනුෂංගික කිසිවක් කිරීමට

සංස්ථාවට බලය තිබිය යුතු ය.".